අභ්‍යාස : ගුරුත්වාකර්ෂණ ක්ෂේත්‍ර

**1. කෘතිම චන්ද්‍රිකාවක් පෘතුවි කේන්ද්‍රයේ සිට අරය r වූ කක්ෂයක වෘත්ත චලිතයේ යෙදේ.**




**I.** චන්ද්‍රිකාවේ වේගය සඳහා ප්‍රකාශනයක් ගොඩනගන්න.

**II.** පෘතුවියේ අරය **R** සහ පෘතුවි පෘෂ්ටය මත ගුරුත්වජ ත්වරණය **g** නම් **V =** $\sqrt{gR}$ බව පෙන්නවන්න.

**III.** **g = 9.8ms$^{-2}$** හා **R = 6.4 x 10$^{6}$ m** නම් **V** හි අගය සොයන්න.

**IV.** චන්ද්‍රිකාවේ අවර්ථ කාලය සොයන්න.

**2.**

**I.** ගුරුත්වාකර්ෂණය පිළිබඳ නිවුටන්ගේ නියමය සඳහා ප්‍රකාශනයක් ලියා එහි ඔබ භාවිතා කල සියලු සංකේත හඳුන්වන්න.

**II.** ස්කන්ධය **M**සහ **R** අරය වූ ඒකාකාර ග්‍රහලෝකයක මතුපිට පෘෂ්ටයේ සිට **h** උසකින් ගුරුත්ව ක්ෂේත්‍ර තීව්‍රතාව

$$g = {}^{GM}/_{(R+h)^2}$$ බව පෙන්වන්න.

**III.** පෘතුවිය සහ චන්ද්‍රයා අතර සම්භන්ධතා කිහිපයක් පහත දැක්වේ.

$$\frac{\text{පෘතුවියේ අරය}}{\text{සඳෙහි අරය}} = 3.7 \qquad \frac{\text{පෘතුවියේ ස්කන්ධය}}{\text{සඳෙහි ස්කන්ධය}} = 81$$

සඳෙහි සිට පෘතුවියට දුර = **3.84 x 10$^{8}$m**

පෘතුවි පෘෂ්ටය මත ගුරුත්ව ක්ෂේත්‍ර තීව්‍රතාව = **9.8Nkg$^{-1}$**

**a)** ඉහත දත්ත චන්ද්‍රයා මතුපිට පෘෂ්ඨයේ ගුරුත්ව ක්ෂේත්‍ර තීව්‍රතාව ගණනයට භාවිතා කරන්න.

**b)** පෘතුවිය සහ චන්ද්‍රයා අතර යම් ලක්ෂයක ගුරුත්ව ක්ෂේත්‍ර තීව්‍රතාව ශුන්‍ය වන ලක්ෂයක් ඇත. පෘතුවි කේන්ද්‍රයේ සිට එම ලක්ෂයට ඇති දුර සොයන්නන.